# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1652/65 – 2010 මැයි 07 වැනි සිකුරාදා – 2010.05.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, ඉඩම් සංවර්ධන ජනාවාස හා රණවිරු සුහසාධන අමාත්‍ය ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බද්දේගම ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ජීඒ/බීඩීඩී/09/211 හා 2009.08.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර "ඒ" වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3466 ක් පමණ වන හිල්ක්‍රොප්ට් වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට: ජාතික ජලසම්පාදන මණ්ඩලය හිමිකම් කියන හිල්ක්‍රොප්ට් වත්ත සහ ගුණපාල වීරතුංග හා තවත් අය හිමිකම් කියන හිල්ක්‍රොප්ට් වත්ත; නැගෙනහිරට: ගුණපාල වීරතුංග හා තවත් අය හිමිකම් කියන හිල්ක්‍රොප්ට් වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ජාතික ජලසම්පාදන මණ්ඩලය හිමිකම් කියන හිල්ක්‍රොප්ට් වත්ත; බටහිරට: ජාතික ජලසම්පාදන මණ්ඩලය හිමිකම් කියන හිල්ක්‍රොප්ට් වත්ත.

ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු,
ඉඩම්, ඉඩම් සංවර්ධන ජනාවාස හා
රණවිරු සුහසාධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2007/ඩබ්එස්/325.
2010 පෙබරවාරි මස 23 වන දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 – 579